**ශීර්ෂය 154 - ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය - විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 154 - ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා` වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 දෙසැම්බර් 23 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

#### (අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 18,364.17 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 11.931.51 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 6,432.66 ක් හෙවත් සියයට 35.03 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 7,788.42 | 7,696.15 | 92.27 | 1.18 |
| ප්‍රාග්ධන | 10,575.75 | 4,235.36 | 6,340.39 | 59.95 |
| **එකතුව** | **18,364.17** | **11,931.51** | **6,432.66** | **35.03** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශය වෙත වෙනත් අමාත්‍යාංශ දෙකක් විසින් එකතුව රු.මිලියන 112.5 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 111.6 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදන වලින් රු. මිලියන 0.9 ක් හෙවත් සියයට 0.8 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 15401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 18.00 | 19.48 | 5.00 | 3.72 | 80.00 | 29.49 |

## 2.3 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය යටතේ වූ අග්‍රිම ගිණුම් හතරක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. මිලියන 18.64 ක් විය. විස්තර පහත දැක්වේ.

| අග්‍රිම ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය | |
|---|---|---|
| | රු.මිලියන | |
| 7002/0000/00/0046/0015/000 | 40. 46 | (හර) |
| 7002/0000/00/0339/0014/000 | 0.81 | (හර) |
| 7002/0000/00/0339/0015/000 | 0.03 | (බැර) |
| 7002/0000/00/0445/0015/000 | 22.60 | (බැර) |
| **එකතුව** | **18.64** | **(හර)** |

## 2.4 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශය යටතේ වන තැන්පත් ගිණුම් තුනක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු. මිලියන 16.00 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0012/0077/000 | 5.00 |
| 6000/0000/00/0015/0029/000 | 8.36 |
| 6000/0000/00/0015/0041/000 | 2.64 |
| **එකතුව** | **16.00** |

## 2.5 විගණන නිරීක්ෂණය

ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණයන් 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ගිණුම් ඉදිරිපත් කිරීම

අමාත්‍යාංශය විසින් 2016 මාර්තු 31 දින වනවිට විසර්ජන ගිණුම හා රජයේ නිලධාරින්ට අත්තිකාරම් පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය විගණනයට ඉදිරිපත් කළ යුතුව තිබුණි. විසර්ජන ගිණුම 2016 මාර්තු 31 දින අඩුපාඩු සහිතව ඉදිරිපත් කර නැවත නිවැරදි කර 2016 ජුලි 11 දින ඉදිරිපත් කර තිබුණි. රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම 2016 සැප්තැම්බර් 08 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 3.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලින කර නොතිබුණු අතර අනෙකුත් ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (i) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳව ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | හානි පාඩු ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (iii) | බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (iv) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |
| (v) | ඉන්වෙන්ට්‍රි ලේඛනය | මුදල් රෙගුලාසි 754 |

(vi) ඇප ලේඛනය — මුදල් රෙගුලාසි 891(1)

(viii) ස්ථාවර වත්කම් ලේඛනය — 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය

## 3.3 විසර්ජන ගිණුම

### 3.3.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 15 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. මිලියන 3,875.58 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 03 ක් සඳහා මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව කටයුතු කර වෙනත් වැය විෂයයන්වලින් එකතුව රු.75,436,599 ක ප්‍රතිපාදන මාරු කර ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එසේ මාරු කරගෙන තිබුණු ප්‍රතිපාදනවලින් රු.69,203,395 ක් හෙවත් මාරු කර ගෙන තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 92 ක ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි

### 3.3.2 අවිනිශ්චිත අවස්ථා අරමුදලින් ලබා ගත් ප්‍රතිපාදන

අමාත්‍යාංශය වෙත අවිනිශ්චිත අවස්ථා අරමුදලින් රු.5,000,000 ක ප්‍රතිපාදන ලබා ගෙන තිබුණි. එසේ ලබා ගත් ප්‍රතිපාදන පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. අමාත්‍යාංශයේ පොත් අනුව එම තැන්පත් ගිණුමෙන් ගෙවීම් කර වර්ෂය අවසාන වන විට රු.931,620 ක ශේෂයක් පැවැතියත්, භාණ්ඩාගාර පොත් අනුව එම ශේෂය රු.මිලියන 5.00 ක් වී තිබුණි. අවිනිශ්චිත අවස්ථා අරමුදලින් ලබා ගෙන තිබුණු අත්තිකාරම් පියවීම සඳහා සමාලෝචිත වර්ෂයේදි පරිපූරක ඇස්තමේන්තුවක් හෝ පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් හෝ ප්‍රතිපාදන ලබා ගත් බවට තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 3.4 අග්‍රිම ගිණුම්

භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය යටතේ අග්‍රිම ගිණුම් අංක 4 ක් පවත්වා තිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට රු.18,637,118 ක හර ශේෂයක් පැවැතුණි. විසර්ජන ගිණුමේ අග්‍රිම ගිණුම් පිළිබඳ සාරාංශ වාර්තාවේ අංක 7002/0000/00/0445/0015/000 යටතේ රු.22,601,033ක බැර ශේෂයක් සඳහන් කර තිබුණි. 2015 දෙසැම්බර් 10 දිනැති අංක 245/2015 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුව වෙනසට හේතු හා ගිණුමේ දක්වා ඇති පොත් අනුව ශේෂයෙහි සංයුතිය පැහැදිලි කර නොතිබුණි.

## 3.5 පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු. 9,193,295 ක්වූ තැන්පතු 05 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විගණනයට ඉදිපත් කළ විෂය අංක 15401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සැසඳුම් ප්‍රකාශයට අනුව වර්ෂය සඳහා වූ මුළු හර කිරීම් හා බැර කිරීම්වලට අදාළ ශේෂයන් අමාත්‍යාංශයේ පොත් අනුව වූ හර කිරීම් හා බැර කිරීම් සහ භාණ්ඩාගාර පොත්වලට අනුව හර කිරීම් හා බැර කිරීම් අගයන් එකිනෙකට වෙනස් විය. මේ හේතුවෙන් විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය අනුව සීමාව ඉක්මවීම සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම අමාත්‍යාංශයේ පොත් හා භාණ්ඩාගාර පොත් සසඳා නොතිබුණි.

(ආ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම හිඟහිට තිබුණු වර්ෂ පහකට වැඩි කාලයක සිට විශ්‍රාම ගිය හා සේවය අතහැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂවල එකතුව පිළිවෙලින් රු.4,261 ක් හා රු.62,776 ක් වී තිබුණි. එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

**3.7 වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

අමාත්‍යාංශයේ නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති වාහන සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අපහරණයට යෝජිත වාහන 18 ක් හා ධාවනයෙන් ඉවත් කළ වාහන 26 ක් ලෙස වාහන 44 ක්ද, වාහන 16ක් මාස 7ක සිට මාස 68 ක් දක්වා කාල පරාසයක සිට නිෂ්කාර්යව පැවතුණි. ධාවනයෙන් ඉවත් කළ වාහන 26 ක් තුළද, වර්ෂ 10 කට අඩු කාලයක් පමණක් භාවිතා කරන ලද වාහන 11 ක් පැවැතුණි. එම වාහන ධාවනයෙන් ඉවත් කිරීම සඳහා කාර්මික නිලධාරීයෙකුද ඇතුළත් සමීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කළ යුතුව තිබුණත්, එසේ සිදු කර නොතිබුණි.

(ii) ඉහත ධාවනයෙන් ඉවත්කළ වාහන 26 තුළ රු.18,000,000 ක් වටිනා ලැන්ඩ්රෝවර්, ඩිෆෙන්ඩර් වර්ගයේ ඩබල්කැබ් රථයක් තිබුණි. එම වාහනය මුදල් අමාත්‍යාංශය මගින් කල්බදු පදනම මත මිලදී ගෙන පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතේ මුල් වරට ලියාපදිංචි කර පසුව මෙම අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණි. එම වාහනය 2015 ඔක්තෝබර් මාසයේ සිට ධාවනයෙන් ඉවත් කර තිබුණ බව සඳහන් කර තිබුණත්, විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව පූර්ව අමානත්‍යාංශය විසින් දේශීය නියෝජිත ගාස්තු නොගෙවා තිබීම හේතුවෙන් වාහනය සේවා කටයුතු සඳහා ඉදිරිපත් කළ අවස්ථාවේදී එම ආයතනය විසින් වාහනය රඳවාගෙන තිබුණු බව ලිපිගොනු පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. පූර්ව අමාත්‍යාංශය වෙතින් නිසි අධිකාරය යටතේ වාහන පවරා ගැනීමට කටයුතු නොකර වාහන රැගෙන ඒම නිසා හා ආයතනය විසින් රජයේ වාහනයක් රඳවා ගැනීම සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග අමාත්‍යාංශය විසින් ගෙන නොතිබුණි.

(iii) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනැති ලිපිය මගින් අමාත්‍යාංශය සඳහා රියදුරන් 30 ක සංඛ්‍යාවක් අනුමත කර තිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය යටතේ අනුයුක්ත රියදුරන් සංඛ්‍යාව 37 ක් වී තිබුණි. කෙසේ

වෙතත් අමාත්‍යාංශ වෙත 2015 දෙසැම්බර් 31 දිනට පැවති වාහන සංඛ්‍යාව 137 ක් වී තිබුණි. ඒ අනුව වාහන 100 ක් ධාවනය කිරීමට අවශ්‍ය රියදුරන් නොමැතිවීම නිසා එම වාහන නිෂ්ක්‍රීයව පැවැති බව නිරීක්ෂණය විය.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

මුදල් රෙගුලාසි 756, 757 හා 1647 ප්‍රකාරව වාහන සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයන් සිදුකර ඒ පිළිබඳ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම අමාත්‍යාංශය වෙත පවරා තිබූ සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයට හා සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයට අයත්ව තිබූ වත්කම්වලින් රු.247,880,093 ක වත්කම් අමාත්‍යාංශයේ ගිණුම්වලට ගෙන තිබුණි. නමුත් එම වත්කම් විධිමත්ව භාරදීමක් සිදු කර නොතිබුණි. මේ හේතුවෙන් ඒවා නව අමාත්‍යාංශය වෙත පවරන ලද ව්‍යාපෘතිවලට අදාළද යන්න හා භෞතිකව භාරයේ පවතින වත්කම්ද යන්න විගණනයෙදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ii) 2015 සැප්තැම්බර් 21 දින සිට අමාත්‍යාංශය වෙත පවරා දී තිබුණු සමාජ සේවා සුබසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වෙතින් ලැබී තිබූ රු.317,629,620 ක් වටිනා වාහන 35 ක් හා අනෙකුත් ඉන්වෙන්ට්‍රි අයිතමයන් 1164 ක් 2015 පෙබරවාරි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා මිලදී ගත් රු.1,532,507 ක ස්ථාවර වත්කම් අයිතමයන් 135 ක් ද, 2016 පෙබරවාරි 09 දින වන විටත් ස්ථාවර වත්කම් ලේඛනයේ හෝ ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

(iii) අමාත්‍යාංශ 03 කින් රැගෙන විත් තිබුණු වාහන 147 කින් 2016 ජුනි 30 දින වන විට වාහන 48 ක් බාහිර ආයතන වෙත ලබාදී තිබුණි. 2015 සැප්තැම්බර් 21 දින සිට 2016 ජුනි 30 දින දක්වා බාහිර ආයතනවලින් ලබා ගත් වාහන 08 ක්ද, ඇතුළත්ව එදිනට අමාත්‍යාංශය සතු වාහන සංඛ්‍යාව 107 ක් විය යුතුව තිබුණත්, එම දිනට විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව වාහන 103 ක් පැවැතී තිබුණි. එම වාහන 103 හි ඉහත වාහනවලට අමතරව වෙනත් බාහිර ආයතන දෙකක් සතුව පැවති වාහන 3 ක් ද විය. ඒ අනුව 2016 ජුනි 30 දිනට අමාත්‍යාංශය සතුව තිබුණු වාහන සංඛ්‍යාව 100 ක් වී තිබුණි.

**(ඈ) බේරුම් නොකළ බැරකම්**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශය විසින් 2015 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂ 1 කට අඩු බැරකම් රු.12,970,958 ක් වී තිබුණි..

(ii) වැය විෂයයන් 7 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා එකතුව රු.945,819 ක බැරකම්වලට එළඹ තිබුණි.

(iii) ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව අමාත්‍යාංශය රු.මිලියන 8.73 ක ණය ගැතියෙකු ලෙස දක්වා තිබුණත්, 2014 විසර්ජන ගිණුමට අනුව පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා අමාත්‍යාංශයේ පශු අංශය යටතේ හෝ 2015 විසර්ජන ගිණුමට අනුව ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය යටතේ හෝ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය නමින් බැරකමක් පෙන්වා නොතිබුණි.

**3.8 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි755 (1) (2) | සේවා ස්ථාන මාරු කිරීම් ආදී අවස්ථාවන් හිදී භාණ්ඩ භාරදීමේදී හා භාණ්ඩ භාර ගැනීමේදී සියළුම රජයේ භාණ්ඩ හා වෙනත් දේපල භාරදී ඒවා භාරදෙන ලද නිලධාරියාගෙන් ඒවා ලැබුණු බවට කුවිතාන්සියක් ලබාගත යුතු වුවද, එසේ සිදුකර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1646 | අමාත්‍යාංශයේ සංචිත වාහන 100 ක දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා එළඹෙන මාසයේ 15 දිනයට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි අංක 1647 (ආ) | වාහනවල භාරකාරිත්වය වෙනස්වන අවස්ථාවල වාහන හා ඒවායේ උපකරණ පිළිබඳව සම්පූර්ණ සමීක්ෂණයන් පැවැත්විය යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| **(ආ) ජනාධිපති කාර්යාලයේ චක්‍රලේඛ** | |
| 2010 මැයි 14 දිනැති අංක CA/1/17/1 දරන චක්‍රලේඛයේ 3 වන ඡේදය | අමාත්‍යවරයාට හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන්කරනු ලබන උපරිම නිල වාහන සංඛ්‍යාව 3 විය යුතු නමුත් එම සීමාව ඉක්මවා ගරු ඇමතිතුමා වෙත වාහන 6 ක් ද ගරු නියෝජ්‍ය ඇමතිතුමා වෙත වාහන 5 ක්ද අනුයුක්ත කර තිබුණි. |

**3.9 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

---

**ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

---

අමාත්‍යාංශය විසින් 2015 සැප්තැම්බර් 21 දින ආරම්භ කිරීමට නියමිතව තිබූ ඇස්තමේන්තුගත පිරිවැය එකතුව රු. මිලියන 4,912.82 ක් වූ ව්‍යාපෘති අටක් 2016 අගෝස්තු 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

**3.10 කාර්යසාධනය**

---

**3.10.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රගතිය**

---

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) අමාත්‍යාංශයේ පශු සම්පත් අංශය විසින් කිරි නිෂ්පාදනය වැඩිකිරීම වෙනුවෙන් 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වර්ෂ 6ක කාල පරිච්ඡේදයක් තුළදී රු.මිලියන 5,213.4 ක් වැය කර තිබුණි. (සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ වියදම් හැර ) 2010 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 126.89 කින් පමණක් වැඩි කර තිබුණි. ඒ අනුව ලීටරයක කිරි නිෂ්පාදන වැඩි කිරීමට රු.41.00 ක් වැය කර තිබුණි. 2015 වර්ෂයේ ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ සඳහන් පරිදි දියර කිරි නිෂ්පාදනයේ ලීටරයක සාමාන්‍ය පිරිවැය රු.32.42 ක් වී තිබුණි. ඒ අනුව කිරි ලීටරයක් නිෂ්පාදනයට වැය වන පිරිවැයට වඩා වැඩි පිරිවැයක් එක ලීටරයකින් කිරි නිෂ්පාදනය වැඩි කිරීමට රජය වැය කර තිබුණි.

(ආ) 2004 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණු දියර කිරි ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය යටතේ කිරි අලෙවි සැල් 1,250 ක් පිහිටුවීමට සැලසුම් කර තිබුණද, 2013 දෙසැම්බර් 31 දින වන විට අලෙවි සැල් 685 ක් ආරම්භ කර තිබුණි. ඉන් අලෙවි සැල් 283 ක් පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් ආරම්භ කර තිබුණු අතර, 2015 වර්ෂය වන විට එයින් අලෙවි සැල් 43 ක් හෙවත් සියයට 15 ක් පමණක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවතුණි. පළාත් මට්ටමින් ආරම්භ කර තිබූ ඉතිරි අලෙවි සැල් 402 කින් වර්තමානයේ අලෙවිසැල් 112 ක් හෙවත් සියයට 28 ක් පමණක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවතුණි. අලෙවිසැල් වැසීයෑම සම්බන්ධව පසු විපරම් කිරීමක් කළ බව තහවුරු කරන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. 2014 වර්ෂයේ හා 2015 වර්ෂයේදී පිළිවෙලින් රු.මිලියන 73.10 ක් හා රු.මිලියන 46.37 ක් වැයකර තිබුණත්, එම මුදල් උපයෝජනය කර ආරම්භ කළ අලෙවිසැල් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අමාත්‍යාංශය විසින් රු. මිලියන 51.00 ක් වැය කර මධ්‍ය පරිමාණයේ කුකුල් ගොවිපලවල් 9,358 ක් හා මස් සැකසුම් මධ්‍යස්ථාන 105 ක් පිහිටුවා තිබුණි. ඒවායේ වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් අමාත්‍යාංශය පසු විපරම් කළ බව තහවුරු කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.10.2 ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

---

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත ආයතන ව්‍යුහයන් අතරින් ග්‍රාමීය පුනර්ජීවන අරමුදල, ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන අරමුදල (මූල්‍ය), ජනදිරිය අරමුදල (ග්‍රාමෝදය මණ්ඩල අරමුදල) යන ආයතන 2016 ජූලි 12 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

## 3.11 අවිධිමත් ගනුදෙනු

--------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි එක් අවස්ථාවක් පහත දැක්වේ.

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

-----------------------------------------------------------------

අමාත්‍යාංශයේ මිලදී ගැනීම් අංශය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව රු.336,310 ක් වටිනා කාර්යාල උපකරණ සෘජුවම ලබා ගෙන පසුව එම බිල්පත් ප්‍රතිපූර්ණය කර තිබුණි.

## 3.12 අනාර්ථික ගනුදෙනු

---------------------

අමාත්‍යාංශය පවත්වාගෙන යන ගොඩනැගිල්ලෙහි 5 වන මහලෙහි වර්ග අඩි 1,386 ක ඉඩ කඩක් 2015 සැප්තැම්බර් මාසයේ සිට කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශය භාවිතා කළද, සම්පූර්ණ 5 වන මහලටම ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය විසින් කුලී ගෙවා තිබුණි. මේ හේතුවෙන් 2015 ඔක්තෝබර් මාසයේ සිට 2016 මැයි මාසය දක්වා මාස 08 ක කාලයක් සඳහා වෙනත් ආයතනයක් විසින් භාවිතා කළ ඉඩකඩක් වෙනුවෙන් අමාත්‍යාංශය විසින් රු.878,768 ක් වැය කර තිබුණි.

## 3.13 කළමනාකරණ දුර්වලතා

---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) වාහන අළුත්වැඩියා කිරීමේදී හෝ අමතර කොටස් සවිකිරීමේදී ඉවත් කරන ලද අමතර කොටස් උපකරණ, මෙවලම් සම්බන්ධව විස්තර ඇතුළත් ලේඛනයක් පවත්වා ගැනීම හා එලෙස ඉවත් කරන ලද කොටස් ආරක්ෂාකාරී ලෙස තබා විධිමත් පරිදි භාරදීමක් සිදු කර නොතිබුණි.

(ආ) 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වත්කම්වලට අදාළ අපහරණ කටයුතු මාස 03 ක් ඇතුළත නිම කළ යුතු ව තිබුණි. 2016 ජනවාරි 26 දින සමීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශ කර තිබුණු අපහරණය හා අළුත්වැඩියා කළයුතු වාහන 30 ක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු 2016 ජුලි 10 දින වන විටත් කර නොතිබුණි. භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් සමීක්ෂණය කළ දින සිට මාස 05 ක් වැනි කෙටිකාලයක් තුළදී අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් විසින් නැවතත් ගැටළු සහගත ලෙස අතිරේක වාහන 15 ක් ධාවනයෙන් ඉවත් කළ යුතු බවට නිර්දේශ කර තිබුණි.

(ඇ) අපහරණය සඳහා නිර්දේශ කර තිබූ වාහන 02 කට අදාළව ලියාපදිංචි සහතික නොතිබුණු අතර, පූර්ව අමාත්‍යාංශයෙන් භාරගත් එක් වාහනයක් සඳහා මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ හිමිකම් සහතික පිටපතේ අයිතිය භාහිර පුද්ගලයකුට හිමි බව විගණනය වෙත ඉදිරිපත් වූ තොරතුරු අනුව නිරීක්ෂණය විය.

(ඈ) අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීම හා අධීක්ෂණය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ගොවීන්ගේ කෘෂි නිෂ්පාදන සෘජුව අලෙවිකර ගැනීම සඳහාත්, නිෂ්පාදකයින්, තොග වෙළෙන්දන් හා පාරිභෝගිකයින් සෘජුවම සම්බන්ධ කිරීම පිණිස අවශ්‍ය වන්නා වූ යටිතල පහසුකම් සලසාදීමෙන් නිෂ්පාදනය සඳහා තරගකාරීත්වය තුළින් කාර්යක්ෂම ලෙස මිල යාන්ත්‍රණය ක්‍රියාත්මක කරවීම අරමුණු කරගෙන විශේෂ ආර්ථික මධ්‍යස්ථාන ආරම්භ කර තිබුණි. කෙසේ වෙතත් ඉන් බලාපොරොත්තු වන

තරගකාරී මිල නිෂ්පාදකයින් සඳහා ලබා දීමත් පාරිභෝගිකයින් සඳහා කාර්යක්ෂම සාධාරණ මිල යාන්ත්‍රනයක් ක්‍රියාත්මක වීමක් සිදු වී ඇති බව තහවුරු කරන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

තවද කුරුදුවත්ත හා නාරහේන්පිට යන ආර්ථික මධ්‍යස්ථානයන්හි කෘෂි නිෂ්පාදන සෘජුව අලෙවිය වෙනුවට වෙනත් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට ඉඩ දී තිබුණි.

(ii) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 12 වන වගන්තිය අනුව අරමුදල් සඳහා මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන්වී මාස 2 ක් ඇතුළත රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ව තිබුණි. නමුත් ආර්ථික මධ්‍යස්ථානවල මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. තවද ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවලද පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- බස්නාහිර පළාතේ පිහිටි ආර්ථික මධ්‍යස්ථාන 6 ක 2008 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන 26 ක්ද, තඹුත්තේගම මධ්‍යස්ථානය සඳහා 2005 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වාත් සහ ඇඹිලිපිටිය, කැප්පෙටිපොල හා වීරවිල පිහිටි ආර්ථික මධ්‍යස්ථාන තුන සඳහා ඒවා ආරම්භ කළ දින සිට 2015 වර්ෂය දක්වාත් මූල්‍ය ප්‍රකාශන 2016 ජුනි 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

- බස්නාහිර පළාතේ පිහිටි මධ්‍යස්ථාන විසින් මූල්‍ය ප්‍රකාශන 19 ක් මාස 4 ක සිට වර්ෂ 61/2 ක් දක්වා පරාසයක කාල පමාවකට පසුව විගණනයට ඉදිරිපත් කර තිබුණි.

- ඒකාකාරී ආකෘතියකට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

(iii) විගණනයට ඉදිරිපත් කර තිබූ සමහර ආර්ථික මධ්‍යස්ථානවල මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගෙවීම් කටයුතු, බැංකු සැසඳුම් හා මුදල් පොත් පවත්වාගන යැම හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම් ආදි කටුතුවලදී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. ආර්ථික මධ්‍යස්ථානවල අතිරික්ත මුදල් ආයෝජනය හා අයවැය ලේඛන පිළියෙල කිරීම සම්බන්ධයෙන් 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2004 ජුලි 29 දිනැති අංක පීඊඩී 25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඉ) ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණු ආර්ථික මධ්‍යස්ථාන සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාරියපොල (රක්ෂිතයේ)විශේෂ ආර්ථික මධ්‍යස්ථානය ස්ථාපිත කර තිබූ ප්‍රදේශය සුදුසු නොවන බව ශක්‍යතා අධ්‍යයන වාර්තාවකින්ද පෙන්වා දී තිබුණි. ඒ පිළිබඳ අවධානය යොමු නොකර 2014 අප්‍රේල් 27 දින එම ආර්ථික මධ්‍යස්ථානය ඉදිකර ආරම්භ කර පසුව වසා දමා තිබුණි. 2015 මැයි 31 දින රු.741,565 ක් වැය කර විවෘත කිරිමේ උත්සවයක් පවත්වා නැවත ආරම්භ කර තිබුණි. 2016 අප්‍රේල් 30 දින වන විට මෙම මධ්‍යස්ථානය කිසිදු භාවිතයකින් තොරව නැවත වසා තිබුණු බව භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

(ii) බුස්ස ආර්ථික මධ්‍යස්ථානය සඳහා ගොඩනැගිලි ඉදිකර තිබුණද, ආර්ථික මධ්‍යස්ථානය ආරම්භ කර නොතිබුණි. මෙම ස්ථානයෙහි පැවති ගොඩනැගිල්ල

සහිත භූමිය 2014 මාර්තු 05 දින විධිමත්ව හික්කඩුව ප්‍රාදේශීය ලේකම් වෙත පවරා තිබුණි. පසුව ප්‍රාදේශීය ලේකම්වරයා විසින් එය 2014 ජුලි 05 දින සාගර විශ්ව විද්‍යාලය වෙත විධිමත්ව පවරා දී තිබුණි. 2016 ජුලි 25 දින වන විටත් එහි කිසිදු සංවර්ධන කටයුත්තකට භාවිතා නොකර පවතින බව හික්කඩුව ප්‍රාදේශීය ලේකම්වරයා විසින් දන්වා තිබුණි.

(iii) වැලිගම, දෙනිපිටිය පොල භූමියේ ඉදිකිරීමට නියමිත විශේෂ ආර්ථික මධ්‍යස්ථානය සඳහා 2014 වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් රු.මිලියන 6.9 ක් වැයකර ඉදිකිරීම් කටයුතු අර්ධ වශයෙන් නිම කර තිබුණි. මෙම ආර්ථික මධ්‍යස්ථානය සම්බන්ධයෙන් නිරීක්ෂණ වාර්තාවක් ලබා ගැනීම සඳහා කමිටුවක් පත් කර තිබුණි. එම කමිටුවේ වාර්තාව අනුව මෙම ස්ථානය ආර්ථික මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවක් නැති බව අමාත්‍යාංශයේ ලේකම්වරිය වෙත දන්වා තිබුණි. ඒ අනුව 2015 නොවැම්බර් 18 දින වන විට මේ සඳහා වැය කළ රු.මිලියන 6.5 ක් නිෂ්ඵල වී තිබුණි.

(ඊ) වසා දමා නොතිබුණත්, නිසි පරිදි ක්‍රියාත්මක නොවන ආර්ථික මධ්‍යස්ථාන සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2011 හා 2013 වර්ෂයන්හිදී ඉදිකිරීම ආරම්භ කර තිබුණු කිලිනොච්චි හා අම්පාර ආර්ථික මධ්‍යස්ථාන ඉදිකිරීමේ කටයුතු පිළිවෙලින් රු. මිලියන 96.7 ක් හා රු. මිලියන 29.2 ක් වැය කර 2013 හා 2014 වර්ෂවලදී අවසන් කර තිබුණි. 2016 ඔක්තෝබර් 11 දින වන විටත් එම කඩ කාමර කුලියට දීම ආරම්භ කර නොතිබුණි.

(ii) 2006 ජනවාරි 25 දින රු.මිලියන 21 ක් වියදම් කර ආරම්භ කර තිබුණු කන්දහන්දිය ආර්ථික මධ්‍යස්ථානයේ පැවති සමස්ථ කඩ කාමර 25 කින් 2016 වර්ෂය වන විට කඩ කාමර 03 ක් පමණක් විවෘත කර තිබුණු බව අභ්‍යන්තර විගණන වාර්තාවලින් පෙන්වාදී තිබුණි.

(උ) අමාත්‍යාංශය විසින් ආර්ථික මධ්‍යස්ථානවල පරිපාලනය සඳහා කාර්යය සංග්‍රහයක් 2016 ජූනි මාසයේ පිළියෙල කර ආර්ථික මධ්‍යස්ථානවල කළමනාකරණ භාරයන් වෙත ඉදිරිපත් කර තිබුණි. ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ඌ) ආර්ථික මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය තනතුරු වැටුප් ක්‍රම ඇතුළත් බඳවා ගැනීමේ පටිපාටියක් අනුමත කර නොතිබුණි. 2016 පෙබරවාරි 12 දිනැති අංක MREA/5/7/General Trust / Vol –II දරන ග්‍රාමීය ආර්ථික පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපිය අනුව ආර්ථික මධ්‍යස්ථානවල සියලුම සේවකයින් රජයේ සේවකයින් නොවන බවත්, ඔවුන් සාප්පු හා කාර්යාල සේවක පනතින් ආවරණය වන බවත් දන්වා තිබුණි.

(එ) වේයන්ගොඩ ආර්ථික මධ්‍යස්ථානයේ කළමනාකරණ භාරයේ සභාපති ලෙස කටයුතු කරන සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා සමුපකාර තොග වෙළඳ සංස්ථාවට අනුබද්ධ CWE ආර්ථික මධ්‍යස්ථාන සේවා පෞද්ගලික සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙසද කටයුතු කර තිබුණි. 2013 වර්ෂයේදී ආර්ථික මධ්‍යස්ථානය වෙත ඉහත සමාගමේ ආරක්ෂක සේවාව ලබාගෙන ඒ සඳහා රු.2,039,290 ක් ගෙවා තිබුණි.

(ඒ) ආර්ථික මධ්‍යස්ථානවල අතිරික්ත මුදල් බැංකු ජංගම ගිණුම්වල නිෂ්ඵලව රඳවා තබා තිබුණි. ආර්ථික මධ්‍යස්ථාන තුනක 2015 දෙසැම්බර් 31 දිනට බැංකු ජංගම ගිණුම්වල එකතුව රු.11,465,552 ක් එසේ නිෂ්ඵලව රඳවා ගෙන තිබුණි.

.

(ඔ) ආර්ථික මධ්‍යස්ථාන 04 ක බාහිර පාර්ශවයන්ට අයත් ඉඩම්වල එකතුව රු.මිලියන 322 ක් වැය කර ගොඩනැගිලි ඉදිකර තිබුණි. තවත් එක් මධ්‍යස්ථානයක බාහිර පාර්ශවයන්ට අයත් ඉඩමක් පවරා ගැනීම සඳහා රු.මිලියන 1.8 ක් වැයකර තිබුණත්, පවරා ගැනීමේ කටයුතු සම්පූර්ණ කර නොතිබුණි.

(ඕ) මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයේ කම්බි දැල් යොදා වටකර මාළු විකිණීම සඳහා සකස් කළ ස්ථානය සහ ඒ තුළ පිහිටි ටයිල් යොදා සකස් කළ මාළු ලෑලි 12 ක් ඇතුළත් ප්‍රදේශය දිගු කාලයක සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. 2013 වර්ෂයේ රු.541,576 කට මිලදී ගෙන තිබූ සීසීටීවී කැමරා පද්ධතිය භාවිතයෙන් තොරව පැවතුණි.

(ක) මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයේ ආරක්ෂාවට උචිත වන ලෙස පැය 24 තුළ ක්‍රියාත්මක වන පොලිස් සේවාවක් ලබා ගැනීමට සහ වැඩ මුරයන් සඳහා ප්‍රමාණවත් ආරක්ෂක නිලධාරින් සංඛ්‍යාවක් ලබා ගැනීමට කළමනාකාරිත්වය කටයුතු කර නොතිබුණි

(ග) ආර්ථික මධ්‍යස්ථානවල කඩ කාමර සඳහා කුලී අය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂයන්හි විවිධ හේතුන් මත ආර්ථික මධ්‍යස්ථානයන්හි කඩ කාමර සඳහා කුලී නිසි පරිදි අය කර නොගැනීම නිසා රු. 97,142,303 ක අලාභයක් රජයට සිදුවී තිබුණි.

(ii) නුවරඑළිය ආර්ථික මධ්‍යස්ථානයේ කඩකාමර 136 කින් 129 කට අදාළ බදු කරුවන් සමඟ විධිමත් ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

(ච) ආර්ථික මධ්‍යස්ථානවල කොන්ත්‍රාත් පාලනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014/2015 වර්ෂයන්වලදී ආර්ථික මධ්‍යස්ථානවල ඉදිකිරීම් හා වැඩිදියුණු කිරීමේ කටයුතු රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර C.W.E. Construction & Engineering මගින් සිදු කර තිබුණි.

(ii) දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත් ප්‍රදනය කිරීමේදී මහජන තරඟයකට යොමුකර අවම පිරිවැයකින් සිදුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම මූල්‍ය හැකියාව හා අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද සැලකිල්ලට නොගෙන ප්‍රජා පාදක නොවන සංවිධාන වෙත සෘජුව කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි.

(iii) වේයන්ගොඩ ආර්ථික මධ්‍යස්ථානයෙහි කඩ කාමර 06 ක් ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(ජ) ආර්ථික මධ්‍යස්ථානවල ඉදිකර තිබුණු වෙළෙඳ පරිශ්‍ර වෙළඳුන් වෙත ලබා දීමේදී ලබගත් ආපසු නොගෙවන ඇප තැන්පත් එම මධ්‍යස්ථානයේ නඩත්තු කටයුතු සඳහා යෙදවීමේ අරමුණින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත ග්‍රාමීය ආර්ථික පුනර්ජනනීය අරමුදලට බැර කර තිබුණි. එම අරමුදලෙහි 2008 ජූනි මාසය වන විට පැවති ශේෂය රු. මිලියන 182.7 කින් රු මිලියන 90 ක් අදාළ අමාත්‍යාංශයේ ආර්ථික මධ්‍යස්ථාන නඩත්තු අරමුදලට බැර කර තිබුණි. ඉන් පසුද 2016 අප්‍රේල් 30 දින වන විටත් ලබාගත් ආපසු නොගෙවන ඇප තැන්පත් එම ගිණුමට තැන්පත් කර තිබුණි. 2016 මැයි 01 දින වන විට එම අරමුදලේ පැවැති රු. මිලියන 29 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.2 ඡේදය අනුව පුනර්ජනනීය අරමුදලේ ගිණුම් සසදා ප්‍රගතිය කාර්තු වශයෙන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යැවීමට හා එම චක්‍රලේඛයේ 3.3 ඡේදය අනුව අරමුදල නීතිගත කිරිමට කටයුතු කර නොතිබුණි.

## 3.14 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 32 | 25 | 07 | - |
| (ii) | තෘතියික මට්ටම | 03 | 02 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 693 | 676 | 17 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 52 | 74 | - | 22 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 04 | 04 | - | - |
| | එකතුව | 784 | 781 | 25 | 22 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්තමානයේ මෙම අමාත්‍යාංශයේ සංවර්ධන හා සැලැසුම් අංශයේ සෘජු අධීක්ෂණයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි ක්‍රියාත්මක වන සංවර්ධන උප ව්‍යාපෘතීන් වන කිතුල් සංවර්ධන ව්‍යාපෘතිය, හස්ත කර්මාන්ත ගම්මාන ව්‍යාපෘතිය, සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ව්‍යාපෘතිය සහ මැටි කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘතිය යන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරීන් 221 ක් අනුයුක්ත කර තිබුණි. එම ව්‍යාපෘතීන් ක්‍රියාත්මක පැවති ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව 9 කට සීමා වී පැවතිනණි. ඒ අනුව එම නිලධාරීන් 221 කින් නිලධාරීන් 212 කගේ සේවය අමාත්‍යාංශය වෙත ලබා නොගෙන නිෂ්කාර්යව පැවැතුණි.

(ආ) පශු සම්පත් සංවර්ධන අංශය යටතේ ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරිම සඳහා එම අංශයට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් 319 ක් විධිමත් පරිදි යොදවා නොතිබුණි.